# වාසනාවේ සංකල්පයක් ලෙස "ලක්ෂ්මී දෙවඟන" ආසියානු සංස්කෘතිය තුළින් පිළිබිඹු වන ආකාරය පිළිබඳව විමර්ශනයක්

එච්.එම්.වයි.පී. වික්‍රමසිංහ

පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය.
yasangapraveenwick@gmail.com

**මුඛ්‍ය පද** - ලක්ෂ්මී, ආසියාව, හින්දු දහම, සෞභාග්‍ය, සංකේතය

## හැඳින්වීම

ලක්ෂ්මී යනු පැරණි භාරතයේ අතීතයේ සිට ම අදහනු ලැබූ දේවතාවියකි. වේද සාහිත්‍යට අනුව ඇය ධනයට, සෞභාග්‍යයට අධිපති දෙවඟනයි. ඇය හින්දු ත්‍රිමූර්තියේ ලෝකය පවත්වාගෙන යෑමේ අධිපති විෂ්ණු දෙවියන්ගේ භාර්යාවයි. පියුමක් මත වැඩසිටින ඇයට අත් සතරකි. එක් අතකින් රන්කාසි වගුරවයි. ඇය රක්ත වර්ණ සාරියක් ඇඳසිටින අතර රන් ආභරණ වලින් සැරසී ඇත. මේ අනුව ලක්ෂ්මී යනු හින්දු දේව සංකල්පයකි. ක්‍රි.ව. තුන්වන සියවසේ දී පමණ ලංකාවේ මුද්‍රණය කළ කාසිවලද යාපහුව දළදා මාලිගාවේ ජනේලයට ඉහළින් ඇති කැටයමක ද ඇගේ රුව ඇත. මෙම සාධක මගින් මෙරටේ හින්දු දහමේ ව්‍යාප්තිය පෙන්නුම් කරන බව ඇතමෙක් පෙන්වීමට උත්සහ කරයි. ඒ අනුව මෙම පත්‍රිකාවේ පර්යේෂණ ගැටලුව වශයෙන් ලංකාවේ හා වෙනත් ආසියාතික රටවල දක්නට ඇති ලක්ෂ්මියගේ සාධක මගින් හින්දු දහමේ ව්‍යාප්තිය පෙන්නුම් කරන්නේ ද නැතිනම් ඇය හුදු සෞභාග්‍යයේ සංකේතයක් ලෙස පමණක් විශ්වාස කරේ ද යන්න පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

ඉහත සදහන් කළ පර්යේෂණ ගැටලුව විසඳීම සඳහා ප්‍රධානම වශයෙන් ක්ෂේත්‍ර නොවන අධ්‍යනය ක්‍රමවේද භාවිතා කරන ලදී. ලක්ෂ්මී සංකල්පය, සුභ සංකේත පිළිබඳව ලියැවුනු විවිධ සාහිත්‍යමය මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. එහිදී මා විසින් පුස්තකාල ග්‍රන්ත සේ ම මේ පිළිබඳව විවිධ විද්වතුන් විසින් ලියා අන්තර්ජාලයේ ශාස්ත්‍රීය ලිපි පළවන වෙබ් අඩවි වල පළකරන ලද සඟරා සහ ලිපිලේඛන ද අධ්‍යයනය කරමින් තොරතුරු ඒකරාශී කොට විශ්ලේශණය කරන ලදී. එසේම අවශ්‍ය කරන ඡායාරූප ආදිය අන්තර්ජාලය ඔස්සේ ලබාගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡා

මෙම පර්යේෂණය අනුව පෙනීගිය එක් කරුණක් වනුයේ ධනය, සෞභාග්‍යය, සශ්‍රීකත්වය, වාසනාව යනාදිය ලබාදෙන්නා වූ ස්ත්‍රී රූපී කාන්තා බලවේගයක් පිළිබඳව භාරතීය සමාජයේ හා හින්දු දහමෙ මෙන්ම ආසියාවේ වෙනත් ආගම් හා සංස්කෘතීන් තුල ද පැවති බවයි.

හීනයාන බුදුදහමේ පන්සියපනස් ජාතක කතා පොතේ 371 වෙනි ජාතකය වන සිරි කාළකණ්ණි ජාතකයට අනුව ලක්ෂ්මී දෙවගන යනු සතරවරම් දෙවිවරු අතර සිටින ධ්‍රතරාෂ්ඨ නම් දෙවියන්ගේ දියණියයි. ඇය රන්වන් වූ ශරීර සොබාවක් ඇතිව, රන්වන් වූ වස්ත්‍රයක් පැලඳ සිටී. ඇය කියාසිටින්නේ තමා ශ්‍රී කාන්තාව බවත් ලක්ෂ්මී යැයි කියන්නේ තමාටම බවත් තමා මනුෂ්‍යාන් හට ඓශ්චර්යය ලබාදෙන බවත්ය. මහායාන බුදුදහමේ ද ලක්ෂ්මී දේවිය පිළිබඳ සදහන් ය. මහායාන ග්‍රන්තයක් වන "ශ්‍රී මහාදේවී ව්‍යාකරණම්" කෘතියට අනුව ලක්ෂ්මිය යනු මතු බුද්ධත්වයට පත්වන්නා වූ බෝධිසත්වවරියකි. අවලෝකිතේශ්වර බෝධිසත්වයන් අමිතාභය බුදුන්ගෙන් ලක්ෂ්මිය මෙවන් ආශ්චර්යයයක් හිමිකරගැනීමට ඇය පූර්ව භවයේ කළ කුසලකර්මය කුමක්දැයි" විමසූ විට උන්වහන්සේ පවසන්නේ ඇය පෙර ආත්මයක රත්නසම්භව ලෝකධාතුවේ ඉපදී බුදුවරුන්ගේ ගුණ

ගායනාකළ පිනෙන් මේ අත්භවයේ ලක්ෂ්මිය වී උපන් බවය. මේ අනුව හින්දු දහමට පරිබාහිරව ද ඒ නමින් ම ලක්ෂ්මී සංකල්පය පිළිබඳ තොරතුරු හමු වේ.

එසේම ආසියාවේ විවිධ රටවල එම නමින්ම නොවුනත් ධනය, වාසනාව හා සෞභාග්‍යයේ දෙවඟනන් පිළිබඳව තොරතුරු හමුවේ. තායිලන්තයේ ජනතාව විශ්වාස කරන පරිදි "නන්ග් ක්වාක්" නම් දෙවගන මිනිසුන්ට ධනය හා වාසනාව ලබාදෙනු ලබයි. ඇය රත්පැහැති සළුවක් හැඳ සිටී. එක් අතක රන් මල්ලකි. එරට ව්‍යාපාරිකයන් තම ව්‍යාපාරික ස්ථානයන්හි ඇයගේ රූපය තබා ඇත්තේ ඇය තම ව්‍යාපාර සඳහා ආරක්ෂාව ලබාදෙනු ඇතැයි යන විශ්වාසය මත ය. චීන බුදුදහමෙහි ද ලක්ෂ්මී සංකල්පයට සමීප දෙවඟනක් වන්දනාමාන කරනු ලැබේ. ඇයව හැඳින්වෙන්නේ "ජිෂියැන්ග් ටිඇන්නු" යන නාමයෙනි. ඇය වෛශ්‍රවණ දෙවියන්ගේ සහෝදරිය වන අතර ධර්මය ආරක්ෂාකරන දෙවිවරුන් විසිහතරදෙනාගෙන් කෙනෙකි. ජපන් විශ්වාසය අනුව වාසනාවේ දෙවගන හැඳින්වෙන්නේ "කිෂිජෝටෙන්" යන නමිනි. මිනිසුන් ආරක්ෂා කරන, අඳුරු බලවේග පලවාහරින ඇය ජපන ජනකතාවල සඳහන් වාසනාව කැන්දන දෙවිවරු හත්දෙනාගෙන් එක්අයෙකි. ඉන්දුනීසියාවේ සෞභාග්‍යය, සශ්‍රීකත්වය ලබාදෙන දෙවඟනගේ නාමය වනුයේ "දේවී ශ්‍රී" යන්නයි. බාලී, ජාවා, සුමාත්‍රා දූපත් ආශ්‍රිතව මෙය ව්‍යාප්තවී ඇත. ඇය කෘෂිකර්මාන්තයට, සශ්‍රීකත්වයට අධිපතිනිය ලෙස සැළකේ. ඇයව නිරූපණය කරන ප්‍රතිමාවල ඇය සිටින්නේ ධාන්‍ය කරළක් අතැතිවයි. ඇය හින්දු ලක්ෂ්මියගේ ස්වරූපයක් වන "ධාන්‍ය ලක්ෂ්මී" සංකල්පයට බොහෝ සමාන ය. කෙසේ වුවද සියුම්ව විශ්ලේශනයේ දී මෙම සියලු දේව සංකල්ප ලක්ෂ්මියගේ ම ස්වරූප ලෙස හඳුනාගත හැකිය.

මේ පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක විමසීමේ දී ක්‍රි.පූ තුන වන සියවසේ ඉදිකළ සාංචි ස්තූපයේ උතුරු තොරණේ ඇතුන් දෙදෙනෙකු විසින් අභිෂේක කරන ලක්ෂ්මී කැටයමක් ඇත. ක්‍රි.පූ. දෙක සියවසට පමන අයත් භාර්හුත් කැටයම්වල ද ලක්ෂ්මී රූපය ඇත. මෙම ස්ථාන බෞද්ධ ස්මාරකය ලෙස පෙන්වාදිය හැක. මේ අනුව ආගම් භේදයකින් තොරව අතීත ජනයා ලක්ෂ්මිය සුභ සංකේතයක් ලෙස විශ්වාස කළ බව පෙනේ. මෙම කාලයේදී ම නිකුත්කළ පංචාල, උජ්ජෙයිනි කාසිවල ද ඇගේ රුව ඇත. මෙය යෙදීමට හේතුව ඇය විසින් ධනය සංකේතවත් කිරීම විය යුතුය. ලංකාවේ ද ලක්ෂ්මී සංකල්පය ජනප්‍රියව තිබූ බව පෙනේ. ක්‍රි.ව. තුන සියවසේ දී පමන නිකුත්කළ කාසිවල ලක්ෂ්මි රූපය ඇත. එහි ඇති අන්දමට නිරුවත් ස්ත්‍රීරූපයක් නෙළුම් දඬු දෙකක් අත් දෙකෙන් දරාසිටින අතර ඇතුන් දෙදෙනෙකු විසින් ඇයව අභිෂේක කරනු ලබයි. මෙය ගජ ලක්ෂ්මී රූපයයි. පොළොන්නරුව යුගයට අයත් නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත සෙල්ලිපියේ ද ගජ ලක්ෂ්මී රූපය නිරූපණය කර ඇත. එසේ ම යාපහුව දළදා මාලිගාවේ ගල් ජනෙල් උළුවහු දෙකට ඉහලින් මෙවැනිම රූප දෙකක් නිරූපණය කර ඇත. මෙරට ගජ ලක්ෂ්මී රූපය බහුලව නිරූපණයට හේතුව මෙරට කෘෂිකාර්මික සමාජය විය හැකි ය. පරණවිතානට අනුව ඇතා මගින් නිරූපණය වන්නේ මේඝයයි. ඇතුන් ජලය ඉසීමෙන් කෘෂිකර්මාන්තයට අත්‍යවශ්‍ය වර්ෂාව ලැබීම සංකේතවත් වනවා විය හැකි ය. නමුත් වන්දනාමාන කිරීමට ඉදිකළ ලක්ෂ්මී රූප මෙරට ඉතා විරළය. පොළොන්නරුව යුගයේ හින්දු බලපෑම පැමිණීමට සියවස් ගණනාවකට පෙර බුදුදහම ඉතා ශක්තිමක්ව පැවති යුගවල පවා මෙරට කාසි වල ලක්ෂ්මිය යෙදීමෙන් පෙනෙන්නේ මෙරට ජනයා ලක්ෂ්මී දෙවගන හින්දු දහමේ ආගන්තුක දෙවිකෙනෙක් ලෙස නොව සෞභාග්‍යයේ, ධනයේ, සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් සැළකූ බවයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**


කුලතුංග, ටී. ජී. (2002), ***ශ්‍රී ලංකාවේ මුදල් හා කාසි ව්‍යවහරය***, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

Boon, J.A. and Eidson, J. R. (1983),***Indonesian Rice Rituals'***,The Journal of Asian Studies, Vol.42 (no03) pp. 730 -733: https://www.jstor.org/stable/2055593